# බලංගොඩ අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය -2021
**Second Term Test - 2021**

07 ශ්‍රේණිය
**Grade - 07**

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

කාලය පැය 02

**නම -**

**සැලකිය යුතුයි.**

- **පළමු කොටසෙහි අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. I සහ II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.**

---

## I කොටස

- **පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි කොටසට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ගුණපාල දුටු ග්‍රාමසේවකතුමා ''**අද කුකුළා අතින් අරගෙනම** ආවා ද ?'' යි විමසුවේය.

1. ප්‍රමාද වී 2. වේලාසනින් ම 3. කුකුළෙක් අරගෙන 4. කලබලයෙන්

02. මා හවස ගෙදර පැමිණි පසු තාත්තා මට **දෙහි කැපුවේ ය**.

1. කතා කළේ ය. 2. බැණ වැදුණේ ය. 3. අගය කළේ ය. 4. වැඩක් පැවරුවේ ය.

- **3, 4 ප්‍රශ්නවල අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පිළිතුර තෝරන්න.**

03. 1. දලදා පෙරහැර 2. ප්‍රශ්ණ පත්‍රය 3. කුරුළු උද්‍යානය 4. විශිෂ්ට ග්‍රන්ථය

04. 1. කොට්ඨාසය 2. විමර්ශණය 3. මර්ධනය 4. වර්දනය

- **මුලින් දී ඇති පදයට සමාන අර්ථය නොදෙන පදය තෝරන්න.**

05. සඳ -

1. තාරපති 2. දිනකර 3. නිසයුරු 4. සිසි

- **මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථය දෙන පදය තෝරන්න.**

06. ප්‍රවීණ -

1. දක්ෂ 2. උගත් 3. ආධුනික 4. අප්‍රවීණ

07. ''ගඟට ඉනි කැපුවා වාගෙයි.'' යන ප්‍රස්තාව පිරුළට වඩාත් සමීප අර්ථය වන්නේ,

1. නුසුදුසු වැඩක් කිරීම 2. නිෂ්ඵල කාර්යයක් කිරීම
3. බුද්ධිමත් වැඩක් කිරීම 4. අපහසු කාර්යයක් කිරීම

- **ප්‍රශ්න අංක 8-9, වාක්‍යංශ වෙනුවට යෙදිය හැකි තනි පදය තෝරන්න.**

08. '' මඩෙහි උපන් ''

1. ජලජ 2. පංකජ 3. අණ්ඩජ 4. කණ්ඨජ

09. ''අවුරුදු සියයක් සම්පූර්ණ වීම''

1. සියවස 2. දශකය 3. සහශ්‍රය 4. අර්ධ ශතකය

10. අව්‍යයය යන පදය අයත් වන්නේ,

1. නාම විශේෂණ පදවලට යි 2. ක්‍රියා විශේෂණ පදවලට යි
3. අනවසාන ක්‍රියා පදවලට යි 4. උපසර්ග පදවලට යි

11. ''තොපි'' යන පදය අයත් වන්නේ,

1. උත්තම පුරුෂ ඒක වචනයට යි. 2. මධ්‍යම පුරුෂ බහු වචනයට යි.
3. ප්‍රථම පුරුෂ බහු වචනයට යි. 4. මධ්‍යම පුරුෂ ඒක වචනයට යි.

12. නූතන සිංහල අක්ෂර මාලාවේ ඇති සඤ්ඤක අක්ෂර ගණන වන්නේ,

1. 10 කි 2. 18 කි 3. 5 කි 4. 42 කි

- **එක් එක් වාක්‍යයේ ඉරි ඇඳි ක්‍රියා පද වර්ගය අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.**

13. ⋆ ඇය ගී **<u>ගයමින්</u>** නැටුවා ය.
⋆ මල්ලී සරුංගලයක් **<u>හැදුවේ ය.</u>**
⋆ ගුරුතුමිය රූප **<u>පෙන්වා</u>** පාඩම විස්තර කළා ය.

1. අවසාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා 2. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
3. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා 4. මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා

14. **කාන්තාවක්** යන්නෙහි අනුක්ත පදය වන්නේ,

1. කාන්තාවෝ 2. කාන්තාවන් 3. කාන්තාවක 4. කාන්තාවකු

15. **රුවල** යන්නෙහි යෙදී ඇති පිල්ලම වනුයේ

1. කෙටි පාපිල්ල 2. කෙටි ඇදය 3. ඉස්පිල්ල 4. ඇලපිල්ල

16. ▲ ඉනික්බෙත් ▲ උරණව ▲ ආචාරි භාග ▲ නිග්‍රහ

ඉහත සඳහන් පදවල අරුත් පැහැදිලි කළ විට නිවැරදි පිළිවෙළ වන්නේ,

1. ඊට පසුව, කෝප වී, ගුරු පඬුරු, අවමාන 2. කෝප වී, ඊට පසුව, අවමාන, ගුරු පඬුරු
3. ගුරු පඬුරු, අවමාන, කෝප වී, ඊට පසුව 4. ඊට පසුව, කෝප වී, අවමානය, ගුරු පඬුරු

17. '' **දිලිහි දිලිහි ආකාසේ බබළන මල් තාරුකා** '' යන කවියෙහි කතුවරයා වන්නේ,

1. මුනිදාස කුමාරතුංග මහතා 2. ආනන්ද රාජකරුණා මහතා
3. එස් මහින්ද හිමි 4. අරිසෙන් අහුබුදු මහතා

- **18 සිට 20 තෙක් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

18. ගංගා පහළට ගලා ............................................

1. බසියි 2. බසිති 3. බැස්සෝ ය 4. බැස්සහ

19. .................................. පුස්තකාලයට ගියෙහි.

1. මම 2. නුඹ 3. තොපි 4. ඔවුහු

20. අම්මා ............................... කැඳවූවා ය.

1. දරුවන් 2. දරුවෝ 3. මම 4. අපි (ලකුණු 2 × 20 =40)

## II කොටස

- **1, 2 ප්‍රශ්න අනිවාර්යය වේ. 3, 4, 5, 6 ප්‍රශ්න අතුරින් තුනක් තෝරාගෙන ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

**01. ලොවට තර්ජනයක් වන විද්‍යුත් අපද්‍රව්‍ය** පාඩමට අදාළව ඔබ කණ්ඩායම විසින් සකස් කරන ලද කණ්ඩායම් ක්‍රියාකාරකම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඔබ කණ්ඩායම විසින් සකස් කරන ලද බිත්ති පුවත්පතට යෙදූ නම කුමක් ද ? (ලකුණු 01)
ii. ඔබ විසින් සැදූ බිත්ති පුවත්පතට ඔබ ඇතුළත් කළ නිර්මාණ දෙකක් ලියන්න. (ලකුණු 02)
iii. බිත්ති පුවත්පත සකස් කිරීමේදී ඔබට පැවරුණු කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 04)
iv. බිත්ති පුවත්පත සකස් කිරීමේදී ගුරුවරයා ලබාදුන් උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 04)
v. බිත්ති පුවත්පත සකස් කිරීමේදී ඔබ කණ්ඩායමට මතු වූ ගැටළුවක් සඳහන් කර එය විසඳාගත් ආකාරය ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 15)

02. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනයක් ලියන්න.

1. වැඩිහිටියන් රැකබලා ගනිමු.
2. පොදු දේපළ සුරකිමු.
3. දහම් පාසල් අධ්‍යාපනයේ අගය.
4. ගැමි දිවියේ මිහිර.
5. අපේ ගමට ගං වතුර ගැලූ දා , (ලකුණු 15)

03. පහත සඳහන් උද්ධෘත ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ)" රජ්ජුරුවන් මා කැඳවා එවන්නේ මට ස්නේහයෙන් නොවෙයි. "

i. මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද ?
ii. මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද ?
iii. එම පාඩම උපුටාගත් ග්‍රන්ථය කුමක් ද ?
iv. එම ග්‍රන්ථය ලියවුණු යුගය කුමක් ද ?
v. මෙම ප්‍රකාශය සිදුකළ පුද්ගලයා ඉන් පසු සිදු කළේ කුමක් ද ?

(ආ) දඟ කරමින් <u>නට නටා</u>
ඇවිදින මුළු ලොව වටා
ගඳඹ කුමරියකි මොළකැටි
ඇති සුරතල් ගති නුරා

i. මෙම පද්‍ය පන්තියේ රචකයා කවුද ?
ii. ඔහු විසින් රචනා කරන ලද ගී පද රචනයක් නම් කරන්න.
iii. ඉහත සඳහන් පද්‍ය පංතිය උපුටාගෙන ඇත්තේ කුමන පද්‍ය සංග්‍රහයෙන් ද ?
iv. ඉහත පද්‍යයේ ඉරි ඇඳි කොටස අයත්වන කාව්‍යාලංකාරය කුමක් ද ?
v. මෙහි සඳහන් **ගඳඹ කුමරියකි** යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු 10 )

04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ශ්‍රී ලංකාවේ ආදිවාසීන් ලෙස සැලකෙන්නේ අතීතයේ සිට අප රටේ විසූ වැදි ජනයා ය. ඉන්දියාවේ සිට පැමිණි විජය කුමරුගේ සහ ඒ අවදියේ ලංකාවේ විසූ කුවේණි නැමති යක්ෂ ගෝත්‍රික කුමාරියගේ දරුවන් වූ ජීවහත්ථ හා දීසාලා යන දෙදෙනාගෙන් වැදි ජනයා පැවත එන බව බොහෝ දෙනාගේ අදහස වෙයි. විසිවන සියවස ආරම්භය තෙක් ම මුළුමනින් ම වනගත ජීවිතයක් ගත කළ වැදි ජනයා මේ වන විට අසල් වැසි සිංහල හා දෙමළ ගම්වල ජනයා හා මිශ්‍ර වී ඔවුන්ගේ සමාජ චාරිත්‍ර හා ජීවන රටා අනුගමනයෙන් වෙනස්වීම්වලට ලක් ව ඇත. වැදි ජනයා පිළිබඳව සී. ජී. සෙලිග්මාන් හා බ්‍රෙන්ඩා සෙලිග්මාන් යන විදේශීය විද්වතුන් මෙන් ම නන්දදේව විජේසේකර, පී. බී. මීගස්කුඹුර යන දේශීය විද්වතුන් ද පර්යේෂණාත්මක ග්‍රන්ථ ලියා ඇත. ආර්. එල්. ස්පිට්ල් වෛද්‍යවරයා වැදි ජනයා හා වෙසෙමින් ලත් අත්දැකීම් නිර්මාණාත්මක ප්‍රබන්ධ ස්වරූපයෙන් ලියා තැබී ය.

(1) ශ්‍රී ලංකාවේ ආදි වාසීන් ලෙස සැලකෙන්නේ කවුද?
(2) ජීවහත්ථ දිසාලා යන දරු දෙදෙනාගේ මව, පියා නම් කරන්න.
(3) ලංකාවේ විසූ කුවේණි නැමැති කුමාරිය කිනම් ගෝත්‍රික කාන්තාවක් ද?
(4) විසිවන සියවස ආරම්භය තෙක්ම වැදි ජනයා ගත කළේ කිනම් ජීවිතයක් ද?
(5) වැදි ජනයා පිළිබඳ පර්යේෂණාත්මක ග්‍රන්ථ ලියා ඇති විදේශීය විද්වතුන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

05. පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කා හට කියන ලද්දේ දැයි ලියන්න.

1. '' ඇයි, ඉතින්, ගැලවෙන විදිහක් ඔබ ම කල්පනා නොකරන්නේ ''

I. කවුරුන් විසින් ද?
II. කා හට ද?

2. '' මේ ගොන් කණුව ළඟ ම ඉන්නේ මුදුනා. ඒයා තමයි මේ ඇඳුත්තේ නායකයා''

I. කවුරුන් විසින් ද?
II. කා හට ද?

3. '' ඊට තොප වික්ෂේප නොව. තොපගෙන් කෑ තලවලට මම මිල දෙමි ''

I. කවුරුන් විසින් ද?
II. කා හට ද?

4. '' එහෙ ගියොත් සුදු අප්පොත් එක්ක සෙල්ලම් කරතැකි ''

I. කවුරුන් විසින් ද?
II. කා හට ද?

5. '' අන්න ! අන්න ! සර් එනවා අපි යං කෝච්චිය ළඟට ''

I. කවුරුන් විසින් ද?
II. කා හට ද?

(ලකුණු 10)

06. අක්ෂර වින්‍යාසය නිවැරදි පදය වරහන් තුළින් තෝරන්න. යටින් ඉරක් අඳින්න.

1. ශබ්ද (විකාශණ, විකාශන ) යන්ත්‍රය
2. (සූර්ය, සූර්‍ය) රශ්මිය.
3. (මහලු, මහළු ) නිවාසය.
4. (ළපටි, ලපටි ) ගොයම
5. කණ්ඨජ ( අක්ෂර, අක්ශර)
6. සාහිත්‍ය (රශාස්වාදය, රසාස්වාදය )
7. පුළුල් (නළල, නලල)
8. (නිශ්වල, නිෂ්චල) දේපළ
9. (අළුත්, අලුත් ) ඇඳුම්
10. (විෂ්මය ජනක, විස්මය ජනක) සිදුවීමකි

(ලකුණු:1×10 =10 යි)

සැකසුම - ඩබ්.එච්. සන්ධ්‍යා හේමමාලි ජයසේකර ,
ර/ශාස්ත්‍රාලංකාර විද්‍යාලය, ඉඹුල්පේ